# <u>ජෝර්දානයේ වෙසෙන ශ්‍රී ලාංකිකයන් වෙත කෙරෙන කාරුණික නිවේදනයයි</u>

දැනට පවතින  වාතාවරණය හේතුකොට ගෙන ශ්‍රී ලංකා තානාපති කාර්යාලය විසින් ශ්‍රී ලාංකික ඔබ වෙත පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කරන ලෙස කාරුණිකව ඉල්ලා සිටිමු.

1. නැවත දැනුම් දෙන තුරු සාමූහික එකතුවීම් සංවිධානය නොකරන ලෙසද, දුර බැහැර විනෝද ගමන් ආදියෙන් වැළකී සිටින ලෙසද, හදිසි අවස්ථා හැරුණු කොට රාත්‍රී කාලයේදී ගමන් බිමන් නොයන ලෙසද,
2. ඔබ සතුව වීසා බලපත්‍රය හෝ වලංගු ගමන් බලපත්‍රය නොමැති නම් පැරණි ගමන් බලපත්‍රයේ පිටපතක්/ ජාතික හැඳුනුම්පත / අනන්‍යතාවය තහවුරු කෙරෙන වෙනයම් ලියවිල්ලක් ළඟ තබාගන්නා ලෙසද,
3. ඕනෑම අවස්ථාවකදී ජෝර්දාන් ආරක්ෂක අංශ ඉල්ලා සිටියහොත් වීසා බලපත්‍රය හෝ ගමන් බලපත්‍රය ඉදිරිපත් කොට තමන්ගේ ශ්‍රී ලාංකික අනන්‍යතාවය තහවුරු කොට ඔවුන්ට සහයෝගය ලබා දෙන ලෙසද,
4. ඕනෑම හදිසි තත්වයකදී ශ්‍රී ලාංකිකයකුට යම් අනතුරක් සිදුවන්නේ නම් එම පුද්ගලයාගේ නම, වැඩ කරන ස්ථානය හා දුරකථන අංකය වහාම තානාපති කාර්යාලය වෙත දන්වන ලෙසද,
5. හදිසි අවස්ථාවකදී පවතින තත්වය පිළිබඳ තොරතුරු නිරන්තරයෙන් ශ්‍රී ලංකා තානාපති කාර්යාලය හා හුවමාරු කරගන්නා ලෙසද,
6. ශ්‍රී ලංකාවේ වෙසෙන තමන්ගේ ළඟම ඥාතීන් වෙත කෙටි පණිවිඩයක් හෝ යවා තමන් පිළිබඳව ඔවුන් දැනුවත් කෙරෙන ලෙසද,
7. තහවුරු කර නොගත් තොරතුරු ප්‍රචාරය නොකරන ලෙසද,

ඉල්ලා සිටිමු.

ඔබගේ ආරක්ෂාව සුරැකීම අපගේ මූලික වගකීම වන හෙයින් හදිසි අවස්ථාවකදී තානාපති කාර්යාලයේ පහත සඳහන් අංක අමතන ලෙසද කාරුණිකව ඉල්ලා සිටිමු.

| | |
|---|---|
| තානාපති කාර්යාලය | - 00962 - 65820611/12 |
| වැඩ බලන දූතමණ්ඩල ප්‍රධානී | - 00962 - 781365773 |
| උපදේශක (කම්කරු හා සුබසාධන ) | - 00962 - 770099944 |
| කොන්සියුලර් නිලධාරි | - 00962 - 781548585 |
| හදිසි ඇමතුම් අංකය | - 00962 - 777313323 ( Hotline Number ) |
| වට්ස්ඇප් අංකය | - 00962 - 777313323 ( WhatsApp Number ) |
| ඊමේල් ලිපිනය | - slemb.amman@mfa.gov.lk ( email address ) |

ශ්‍රී ලංකා තානාපති කාර්යාලය
ජෝර්දානය
2026.03.02